සැබැවින්ම අල්ලාහ් මැවූ පළමු දේ පන්හිදය. පසුව ඔහු එයට: ලියනු යැයි පැවසීය. මාගේ පරමාධිපතියාණනි! මා ලිවිය යුත්තේ කුමක් දැයි එය විමසීය. අවසන් හෝරාව ක්රියාත්මක වන තෙක් පවතින සෑම දෙයකම නියමයන් ලියනු යැයි ඔහු පැවසීය.

උබාදා ඉබ්නු අස්-සාමිත් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. අහෝ මාගේ පුතනුවනි! සැබැවින්ම නුඹට හිමි වූ දේ නුඹට වැරදෙන්නට තිබූ එකක් නොවන බවත් නුඹට වැරදුනු දේ නුඹට හිමිවන්නට තිබූ එකක් නොවන බවත් නුඹ වටහා ගන්නා තෙක් ඊමාන් හෙවත් විශ්වාසයේ සුවය නොලබන්නෙහුමය. අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්රකාශයකට මම මෙසේ සවන්
දී ඇත්තෙමි. “සැබැවින්ම අල්ලාහ් මැවූ පළමු දේ පන්හිදය. පසුව ඔහු එයට: ලියනු යැයි පැවසීය. එය මාගේ පරමාධිපතියාණනි! මා ලිවිය යුත්තේ කුමක් ද? යැයි විමසීය. අවසන් හෝරාව ක්රියාත්මක වන තෙක් සෑම දෙයකම නියමයන් ලියනු යැයි ඔහු පැවසීය. අහෝ පුතනුවනි, අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා පවසා සිටි තවත් ප්රකාශයකට මම මෙසේ සවන් දී ඇත්තෙමි. “මේ හැර වෙනත් පදනමක් මත වී කවරෙකු මිය ගියේ ද ඔහු මගෙන් කෙනෙකු නොවන්නේය.” අහ්මද් හි සඳහන් තවත් වාර්තාවක: “අල්ලාහ් මැවූ පළමු දේ පන්හිදය. පසුව ඔහු එයට: ලියනු යැයි පැවසීය. එවිට එම හෝරාවේ මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය දක්වා සිදුවන දෑ සමග එය ක්රියාත්මක වන්නට විය.” ඉබ්නු වහබ් සතු වාර්තාවක මෙසේ සඳහන් වෙයි. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මෙසේ පැවසූහ. “කවරෙකු තම යහපත හෝ අයහපත පෙර නියමය අනුව සිදුවන බව විශ්වාස නොකළේ
ද අල්ලාහ් ඔහුව අපා ගින්නෙන් පුළුස්සා දමනු ඇත.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [දෛවය පිළිබඳ පාඩමෙහි ඉබ්නු වහබ් එය වාර්තා කර ඇත - ඉමාම් තිර්මිදි එය
වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

සැබැවින්ම උබාදා ඉබ්නු අස්-සාමිත් (රළියල්ලාහු අන්හු) තුමා ඔහුගේ පුතු වලීද්ට හොද හෝ නරක හෝ වේවා පෙර නියමයට අනුව එය සිදුවන බව විශ්වාස කරන මෙන් උපදෙස් දුන්නේය. එමෙන්ම එය විශ්වාස කිරීම මත මෙලොවෙහි හා මතුලොවෙහි හිමිවන යහපත් ප්රතිඵල හා යහපත් ප්රයෝජන ගැන ද පෙළගස්වා පැහැදිලි කළේය. එමෙන්ම පෙරනියමය ප්රතික්ෂේප කිරීමෙන් මෙලොවෙහි මෙන්ම මතුලොවෙහි ඇතිවන අනතුරු හා නපුරුකම් පිළිබඳවද පෙළගස්වා පැහැදිලි කළේය. හෙතෙම තමන් පවසා සිටි දෑ සඳහා අල්ලාහ්ගේ දූතයාණන් ගේ පිළිවෙත සාධක ලෙස ඉදිරිපත් කළේය. සැබැවින්ම අල්ලාහ් පෙර නියමයන් නියම කළේය. මෙම මැවීම් බිහිවීමට පෙර ඒවා ලියන්නට පන්හිදට නියෝග කළේය. එබැවින් මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය දක්වා පවතින කිසිවක් පෙර නියමය හා පෙර තීන්දුව අනුව මිස මෙලොවෙහි සිදු වන්නේ නැත.

http://www.sunnah.global/hadeeth/si/show/5979